

# සසුන රකින පාලි

චම්පික රණවක

# සසුන රකින පාලී

චම්පික රණවක

නොනිමි මෙහෙවරින් 1 ට

# සසුන රකින පැවිදි

## චම්පික රණවක

### නොනිමි මෙහෙවරින් 1 ට

**සංස්කරණය**

දර්ශනපති හැඩිගල්ලේ විමලසාර හිමි

ශාස්ත්‍රපති පස්සරමුල්ලේ දයාවංස හිමි

මහේෂ් රංගන ජයරත්න

---

**ඡායාරූප**

තුසිත සංජීව

සුභාෂ් ප්‍රියංකර සේමසිංහ

අමාත්‍යංශ මාධ්‍ය ඒකකවල ඡායාරූප ශිල්පීන්



# පාඨලී චම්පික රණවක නම් ඔහු..

"නා චින්තයන්තො පුරිසො
විසෙසමධි ගච්ඡති"
(නොසිතන්නා විශේෂයට නොපැමිණේ)

දර්ශනයක්, දැක්මක් සහිත පුද්ගලයෙකුට යම් වගකීමක් හෝ තනතුරක් පැවරූවිට ඔහු විසින් ස්වකීය පරිකල්පන ශක්තිය භාවිතා කරමින් එකී විෂය ක්ෂේත්‍රය හෝ තනතුර විශේෂත්වයට පත්කර, තමන් ද සුවිශේෂී පුද්ගලයෙකු බවට පත්වන බව පෙළ දහමෙහි ඉගැන්වේ. එකී ඉගැන්වීම නිවැරදි බව තම භාවිතයෙන් ඔප්පුකර ඇති පාඨලී චම්පික රණවක නම් සිංහල බෞද්ධ ජාතිකවාදී නායකයා විසින් ස්වකීය පරිකල්පන බුද්ධිය මෙහෙයවීමෙන් තමා වෙත පැවරෙන කවර වගකීමක් වුවත් මැනවින් ඉටුකර ඇත.

**කියන දේ කරන, කරන දේ කියන ඔහු,**

- ප්‍රායෝගිකවාදී දේශප්‍රේමියෙකි
- කුසලතාපූර්ණ වෘත්තීයවේදියෙකි
- තුන්කල් දකින ප්‍රතිපත්ති සම්පාදකයෙකි
- දැයට ප්‍රාණය ලබාදුන් ලේඛකයෙකි
- රටට වැඩක් කළ අමාත්‍යවරයෙකි

# ආවර්ජනා







# ප්‍රායෝගිකවාදී දේශප්‍රේමියා...

මොරටු විශ්වවිද්‍යාලයෙන් විදුලි ඉංජිනේරුවරයෙකු ලෙස උපාධිය ලබාගැනීමෙන් පසුව විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ගණිත අංශයේ උපදේශකයෙකු වශයෙන් සිය වෘත්තීය ජීවිතය ඇරැඹි චම්පික රණවක නම් යෞවනයා 90 දශකයේ වේගයෙන් වැඩෙමින් පැවති ත්‍රස්තවාදය හා බෙදුම්වාදී මතවාදය පරාජය කිරීම ජාතිය හමුවේ ඇති ප්‍රධානම අභියෝගය බව අවබෝධ කරගෙන, එකී අභියෝගය ජයගත හැකි මඟක් සෙවීමට තම කාලය හා ශ්‍රමය වැයකළේ නිස්සරණාධ්‍යාශයෙනි.

1994 දී බලයට පැමිණි නව ආණ්ඩුව හොර රහසේ සකස් කළ රට බෙදන දේශපාලන යෝජනාවලිය හෙවත් පැකේජය පළමුව ජනයාට අනාවරණය කළේ චම්පික රණවකයන්ය. ඒ එදා දිවයින පුවත්පතට විචාරාත්මක ලිපියක් සපයමිනි. බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කිරීමට මෙන්ම රටේ ඒකීයභාවය ආරක්ෂා කර ගැනීම, පුවත්පත්වලට ලිපි සැපයීමෙන් හෝ පොත පත රචනා කිරීමෙන් පමණක් කළ නොහැකි බව අවබෝධ කරගත් ඔහු එකී අරමුණු මුදුන්පමුණුවා ගත හැක්කේ ප්‍රායෝගික දේශපාලන ප්‍රවේශයකින් පමණක් බව විශ්වාස කළේය.

ඒ අනුව රුදුරු කොටි ත්‍රස්තවාදයෙන් මවිබිම මුදාගත හැකි මඟක් සෙවීමට තම ජීවිත කාලයම කැපකළ යුතු බව තීරණය කළ චම්පික රණවකයන් ප්‍රථමයෙන්ම සිදුකළේ සිය විශ්වවිද්‍යාල උපදේශක තනතුරෙන් සමුගැනීමය. කිසිදු පැකිළීමකින් තොරව තම වෘත්තීය ජීවිතයට සමුදුන් ඔහු එතැන් පටන් පෙඩරල් පැකේජයට එරෙහිව බිහි වූ ජාතික ඒකාබද්ධතා කමිටුව, ජාතික සංඝ සභාව, සිංහල වීර විදහන ආදී ජාතික සංවිධාන සමඟ මහත් කැපවීමෙන් දිවා රෑ නොතකා වැඩ කළේය.





එවකට රජයේ ෆෙඩරල් පැකේජය වෙනුවෙන් පෙනී සිටි ඇමැතිවරුන් සමඟ ජාතික ඒකාබද්ධතා කමිටුව විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ සංවිධානය කළ විවෘත සංවාදයේ දී ජාතික සංවිධාන නියෝජනය කරමින් දේශන පැවැත්වූයේ පූජ්‍යපාද මාදුළුවාවේ සෝභිත හිමියන් හා අධිනීතිඥ එස්. එල්. ගුණසේකර මහතා සමඟ චම්පික රණවකයන්ය. ඔහුගේ කථිකත්වය මෙන්ම දැනුම ද ජාතික මට්ටමින් මෙරට ජනතාව හඳුනාගත්තේ එමඟිනි. චම්පික රණවකයන් දේශප්‍රේමී ගිහි පැවිදි උතුමන්ගේ ගෞරවාදරයට පත්වූයේ ද එතැන් සිටය.

වර්ෂ 1994 දී බලයට පැමිණි පොදුජන පෙරමුණු ආණ්ඩුව සමඟ උපක්‍රමිකව සටන් විරාමයකට එළඹුණු කොටි ත්‍රස්තවාදීන් විසින් තම යුද ශක්තිය තරකර ගැනීමෙන් පසුව 1995 වසරේදී එකී සටන් විරාමය ඒකපාර්ශවීයව බිඳදැමීමට කටයුතු කරනු ලැබිණි. ඉන් අනතුරුව කොටි ත්‍රස්තයන් විසින් හමුදා පොලිස් සාමාජිකයන් ඉලක්ක කරගෙන පහරදීම, සිවිල් වැසියන් ඝාතනය කරමින් ගම්මානවලට පහරදීම සහ කොළඹ අගනගරය ඇතුළුව ජනාකීර්ණ නගර මධ්‍යයේ බෝම්බ පුපුරුවමින් දහස් ගණනින් මනුෂ්‍ය ඝාතන සිදුකරද්දී ත්‍රස්තවාදයට එරෙහිව සිවිල් ජනතා බලයක් සංවිධානය කිරීමට "ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය" බිහි කළේ චම්පික රණවකයන්ය.

ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය එවකට උදාර මෙහෙවරක් ඉටු කළේය. 1999 වසරේ වන්නියේදී යුද හමුදා පරාජය ලබද්දී මහ සඟරුවන පෙරටු කර ගනිමින් හමුදාවේ මානසික ශක්තිය නංවාලීමට ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය ක්‍රියා කළේ චම්පික රණවක මහතාගේ මඟ පෙන්වීම යටතේය. ඔහු එසේ ක්‍රියාකරද්දී එකී තීරණාත්මක අවධියේදීම සුදු නෙළුම් ව්‍යාපාරය, තවලම වැනි වැඩසටහන් හරහා යුද හමුදාවන්ගේ මානසික ශක්තිය බිඳලීමට කටයුතු කළේ නූතන ව්‍යාජ දුටුගැමුණුලා විසිනි. රටේ ඒකීය භාවයට එරෙහිව ෆෙඩරල් රටක් බිහිකිරීම වෙනුවෙන් මෙකී නූතන ව්‍යාජ දුටුගැමුණුලා එදා පෙනීසිටියහ. එහෙත් චම්පික රණවක එදත් අදත් එකම දේශප්‍රේමී ස්ථාවරයක කටයුතු කරයි.

2000 වර්ෂයේ අලිමංකඩ කඳවුරට පහරදී භානු, තීපන්, කරුණා ඇතුළු කොටි නායකයින් විසින් හමුදා රණවිරුවන් දහස් ගණනක් ඝාතනය කර යාපනය ද අල්ලා ගැනීමට සැරසෙද්දි එවකට දකුණේ පැවැති දීන දේශපාලනයට එරෙහිව අදීන දේශපාලන ව්‍යාපාරයක් "සිහළ උරුමය" නමින් ඇරඹීමට පෙරමුණ ගත්තේ ද චම්පික රණවකයන්ය.

2001 දී අත්සන් කළ රනිල් - ප්‍රභාකරන් විසින් සටන් විරාම ගිවිසුම මතින් රණවිරුවන් හීන දීන තත්ත්වයකට පත්කර තිබියදී කොටින්ගේ මනිරාසකුලම කඳවුර ඉවත් කරගැනීමට බලකරමින් සිහළ උරුමය විසින් එම කඳවුරට අභීතව ගමන් කළ පාගමන සංවිධානය කළේ චම්පික රණවකයන්ය.

**2003 වසරේ දී පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමියන් අම්පාර වලතාපිටියේදී සෙල්ලිපි පරීක්ෂා කරමින් සිටිය දී නැගෙනහිර කොටි නායක කරුණා විසින් එයට අවහිර කිරීමෙන් පසු ඊට එරෙහිව මහ සඟරුවන සමඟ වලතාපිටියට විරෝධතා පාගමනක් සංවිධානය කළේ ද චම්පික රණවකයන්ය**

2004 දී ජාතික හෙළ උරුමය නමින් මහසඟරුවන මහ මැතිවරණයට ඉදිරිපත් වූයේ එලෙස ඇරැඹි සිහළ උරුමයේ නාමය හා ලාංඡනය වෙනස් කරගනිමිනි. එම වර්ෂයේ අප්‍රේල් මාසයේ පැවති එම පාර්ලිමේන්තු මහමැතිවරණයේ දී විප්ලවීය වෙනසක් කරමින් ශාසනික චිරස්ථිතිය වෙනුවෙන් පාර්ලිමේන්තු ආසන 09ක් දිනාගැනීමට

ජාතික හෙළ උරුමයට හැකියාව ලැබිණි. එහිදී එතෙක් පැවති පාර්ලිමේන්තු සම්ප්‍රදාය වෙනස් කරමින් තෙරුවන් වන්දනා කර ව්‍යවස්ථාදායක සභාවේ කටයුතු ආරම්භ කිරීමටත්, ලාංකික දේශපාලන මඩගොහොරුව තුළ පරමාදර්ශී දේශපාලන සංස්කෘතියක් බිහිකිරීම සඳහා පෙරමුණ ගැනීමටත් ජාතික හෙළ උරුමයට හැකිවිය. එලෙස සක්‍රීය දේශපාලන ව්‍යාපාරයක් බවට පත්වූ ජාතික හෙළ උරුමයේ ප්‍රතිපත්ති සම්පාදකයා වූයේ චම්පික රණවකයන්ය. ඔහුගේ මෙහෙයවීම යටතේ ජාතික හෙළ උරුමය විසින් ජාතියට දිනාදුන් ජයග්‍රහණයන් රැසකි.

2004 සුනාමියෙන් පසු විනාශවූ දේපල හා ජීවිත ගොඩනංවන්නට ඕමල්පේ සෝභිත නාහිමියන්ගේ මූලිකත්වයෙන් පානදුර සාගර මාවතේ සුනාමියෙන් දින 40 කින් පළමු ස්ථිර නිවාස ව්‍යාපෘතිය විවෘත කෙරිණි. එය බිඳවැටීමෙන් නැගී සිටීමේ පළමු පියවර විය. එය නිවාස 700ක් තරම් දුරදිග ගිය ව්‍යාපෘතියක් බවට පසුව පත්විය. සුනාමි සහන මණ්ඩලය නමින් කරළියට ආ ප්‍රභාකරන්ගේ අන්තර්පාලන යෝජනාවට එරෙහිව (2005) ඕමල්පේ සෝභිත හිමිපාණන් වහන්සේ මාරාන්තික උපවාසයක් ආරම්භ කළහ. නීතිමය ලෙසද, සමාජමය ලෙසද, මහනායක හිමිවරුන්ගේ සිට යෝධ ජාතික සමගියකින් සුනාමි සහන මණ්ඩලය පරාජය කෙරිණි.

තවද, අපවත්වී වදාළ ගංගොඩවිල සෝම හිමියන්ගේ අභිරහස් අපවත්වීම සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමක් පත්කර, වරදකරුවන් හඳුනාගැනීමටත්, ඔවුන්ට එරෙහිව ජාත්‍යන්තර නීතිය යටතේ අපරාධ චෝදනා ගොනුකරවීමටත් ජාතික හෙළ උරුමයට හැකියාව ලැබිණි. එමෙන්ම, අපවත්වී වදාළ මඩිහේ පඤ්ඤාසීහ යතීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය විසින් දිගින් දිගටම ඉල්ලීම් කළ සිංහ ලකුණ බියර් කෑනයෙන් ගැලවීමත්, දුම්වැටි හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික අධිකාරී පනත සම්මත කර, පෙර රජදරුවන් බුදුන්ට පිදූ මව්බිම නැවතත් ධර්ම රාජ්‍යයක් බවට පත්කිරීමේ කටයුතු ඇරඹීමටත් ජාතික හෙළ උරුමයට හැකියාව ලැබිණි.

ඒකීය රටක් වෙනුවෙන් ජනාධිපතිවරණයක් (2005) දිනාගැනීමට හෙළ උරුමය මුල්විය. ඉන් පසු ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනාටම "රටේ ඒකීයභාවය" මුල්කරගත් පංචවිධ ප්‍රතිපත්තියක් පිළිගැන්විණි. එය පිළිගත්තේ එවකට අගමැති මහින්ද රාජපක්ෂය. ඔහු ජනාධිපති කිරීමේ සටනේ ඉදිරිපෙළ ක්‍රියාධරයෙකු වූයේ චම්පික රණවකයි.

මාවිල්ආරු (2006 ජූලි 21) සිද්ධිය මත ත්‍රස්තවාදයට අවසන් මරු පහර දෙන්නට ජාතික හෙළ උරුමය විසින් තීරණය කරන ලද අතර, ඒ අනුව මාවිල්ආරුවට ගොස් "කොටි පැරදවිය යුතුය - කොටි පැරදවිය හැකිය" යන ජනමතය ඇති කිරීමට මූලිකත්වය ගන්නා ලදී.

2007 අයවැයේදී ආණ්ඩුව පරදවා ත්‍රස්ත විරෝධී යුද්ධය වැලැක්වීමේ කුමන්ත්‍රණය පරාජය කිරීමට පාඨලී වීර්යවන්තව ක්‍රියාකළේය. අනුරාධපුර ගුවන් කඳවුර විනාශකළ විට රූපවාහිනියට හා මාධ්‍යවලට ගොස් ජාතිය දෙපයින් සිටුවන මානසික මෙහෙයුමට ඉදිරිපත්වූයේ ඔහු පමණි. දේශප්‍රේමීත්වයට නව අරුතක් එක් කරමින් 2015 වසරේ දී හොරකමට, අල්ලසට, දූෂණයට එරෙහි "යුක්තියේ ජනරාශිය" නම් ව්‍යාපාරය බිහි කිරීමට පෙරමුණ ගත්තේ චම්පික රණවක නම් නිර්මාණශීලී දේශප්‍රේමියාය.

# කුසලතාපූර්ණ වෘත්තීයවේදියා...

විවෘත විශ්ව විද්‍යාලයේ උපදේශකයෙකු ලෙස පාඨලී 1993-99 කාලය තුළ සේවය කළ අතර. ඔහුගේ "සංවර්ධනයේ තුන්වැනි යාමය" හා "සාපේක්ෂා" නම් කෘති බිහිවුණේ එහිදී සිදුකළ වෘත්තීය දාර්ශනික සංවාදයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

නව ගණිත ක්‍රමයක් වන හින්දු ආගම පදනම් කරගත් "වේද ගණිතය" ලංකාවට හඳුන්වා දුන් පාඨලී සංඛ්‍යා ඇගැයීමේදී එය සන්තතික ද, අසන්තතික ද යන වටපිටාව අනුව ඒවායේ අරුත වෙනස් වන බව ප්‍රකාශ කරමින් සකසන ලද නිබන්ධනයක් චම්පික රණවක විසින් ඉන්දියාවේ පැවැත්වූ දාර්ශනික සම්මන්ත්‍රණයකට ඉදිරිපත් කරනු ලැබිණි.

කාර්මික විද්‍යාවන්හිදී කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය මැනීම අසම්පූර්ණ බවට ද පාඨලී ප්‍රවාදයක් ගෙන ආවේය.

අනු පරමාණු ලෝකයේ හැසිරීම් නව ආකාරයකින් පහදා දෙන සරල ප්‍රවාදයක් පාඨලී විසින් 1991 වසරේ පැවති දාර්ශනික සමුළුවකදී ඉදිරිපත් කරනු ලැබිණි.

ඩාවින් ඉදිරිපත් කළ සියලු දේ සරල ක්‍රියාවන්ගේ සිට සංකීර්ණ ක්‍රියාවලි බවට පත්වේ යන සහ වෙනස්වීමේදී අභ්‍යන්තරයේ සිදුවන ජීව විකාශය මූලිකවේ යන මූලධර්මයන්ට චම්පික රණවක අභියෝග කළේය.

සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ "මනෝ විශ්ලේෂණවාදයට" දාර්ශනිකව අභියෝග කළ ඔහු තිරසර සංවර්ධනය සහ හරිත ආර්ථිකය සඳහා විධිමත් දාර්ශනික වෘත්තීයභාවයක් ලංකාවේදී එක් කළේය.



# තුන්කල් දකින ප්‍රතිපත්ති සම්පාදකයා...

දේශයේ සම්ප්‍රදාය හා සංස්කෘතික මූලයන් පිරිසිඳ දත් පාඨලී නවීනත්වයේ සාධනීය ගුණයන්ද මුසු කරමින් ශ්‍රී ලංකාව ලෝක සිතියමේ අනභිභවනීය තැනකට ඔසොවා තැබීම සිය මූලික ප්‍රතිපත්තිය කර ගත්තේය. 2005 - 2010 මෙන්ම 2015 ජනපතිවරණ වලදී එළිදුටු ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හී සඳහන් නිර්මාණශීලී සැලසුම්, යෝජනා බොහොමයක් නිර්මාණය වූයේ ඔහු අතිනි.

දක්ෂ අමාත්‍යවරයෙක් ලෙස ඇගයුම් ලැබූ ඔහු,

- පාරිසරික සහ ස්වභාවික සම්පත් අමාත්‍යවරයා ලෙස "හරිත ලංකා" වැඩසටහන සඳහා 2010 සිට 2020 දක්වා දස අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම
- විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා ලෙස "බලශක්තියෙන් බල ගැන්වූ දේශයක්" වෙනුවෙන් දැනුම් කේන්ද්‍රීය ආර්ථිකයක් සඳහා ශ්‍රී ලංකාවේ දස අවුරුදු බලශක්ති සංවර්ධන සැලැස්ම (2015-2025)
- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා ලෙස "ජාතික පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන රාමුව"
- මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා ලෙස "ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය" මෙන්ම බස්නාහිර මහානගර සංවර්ධන ප්‍රධාන සැලසුම වැනි ජාතික ප්‍රතිපත්ති සැකසීම සඳහා නායකත්වය ගැනීමෙන් "ප්‍රතිපත්ති සම්පාදකයෙක්" ලෙස පාඨලීගේ සුහුරු බව ප්‍රකට කරයි.





## දැයට ප්‍රාණය ලබාදුන් ලේඛකයා...

දේශපාලනය, සංවර්ධනය, ත්‍රස්ත්‍රවාදය, සිංහල උරුමය හා අභියෝග, මුස්ලිම් අන්තවාදය, පරිසරය සහ බලශක්ති ක්ෂේත්‍රය මුල් කර ගනිමින් පාඨලී සිය ප්‍රකාශන එළිදක්වා ඇත.

- අපේ මග (1989)
- සංවර්ධනයේ තුන්වැනි යාමය (1991)
- සාපේක්ෂා (1997)
- ත්‍රස්ත විරෝධී ජාතික සැලැස්ම (1999)
- කොටි විනිවිදීම (1999)
- උතුරු නැගෙනහිර සිංහල උරුමය (1999)
- සිහළ අභියෝගය (2001)
- අල්ජිහාද් අල්කයිදා (2003)
- හරිත අරුණ (2009)
- පටිසෝතගාමීව තිස්වසක් (2009) - ස්වයං ලිඛිත චරිතාපදානය
- හෙට මුළු රට එළියයි (2011)
- එහි පස්සිකෝ (2011)
- බලය සහ බලය (2014)
- ආලාපාළු ආර්ථිකය - මෙගා ඩීල් ද? නවෝත්පාදනයද?
- Beyond the Metaphysics of Common Sense (1998)
- Strip of Tigers (2000)
- Dawn of New Green Era (2008)
- Charge of the Lion Brigade (2009)
- Illuminating the Future (2011)
- Power and Power (2014)



## රටට වැඩක් කළ අමාත්‍යවරයා...

පාඨලී චම්පික රණවකයන් ඇමැතිවරයෙකු ලෙස මව්බිම වෙනුවෙන් සිදු කළ මෙහෙවර අනභිභවනීය ය. ඇමැතිවරයෙකු ලෙස දොළොස් වසරකට අධික කාලයක් ඔහු කළ බොහෝ වැඩ මහා භාණ්ඩාගාරයට බරක් නොවීය. අමාත්‍යංශවලට අයත් ආයතන ලාභ ලැබීය. ඒ ලාභයෙන් ඔහු අලුතින් වැඩ කළේය.

2007 වසරේදී ප්‍රථම වරට අමාත්‍යවරයෙකු බවට පත්වූ ඔහු පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා ලෙස වනසංරක්ෂණ ආඥා පනත, වනජීවී ආඥා පනත හා ජාතික පරිසර පනත යන ප්‍රධාන පරිසර පනත් 03ම කෙටිකාලයකින් යාවත්කාලීන කිරීම ඇතුළුව අණපනත් රාශියක් සම්මත කර පාරිසරික සහ ස්වාභාවික සම්පත මතු පරපුරට දායාද කළ අතර ඕසෝන් වියන රැකගැනීමට ඔහු විසින් ඉදිරිපත් කළ නව සංකල්පය නිසා වියානා සම්මුතියේ සභාපතිධුරය දිනාගැනීමට චම්පික රණවකයන්ට හැකියාව ලැබිණි.

තවද, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා ලෙස රාජ්‍ය දැවසංස්ථාව ජාතික ඵලදායිතා සම්මානයෙන් පිදුම් ලැබීමට සුදුසු ආයතනයක් බවට පත්කළ ඔහු කැලිකසළ අර්බුදයට විසඳුමක්වූ "පිළිසරු ජාතික වැඩසටහන", දේශීය ශාක පද්ධතිය රැකගැනීමට "හෙළතුරු වියන" වැඩසටහන, අලි මිනිස් ගැටුම වැලැක්වීමට "ගජමිතුරෝ" වැඩසටහන ඇතුළු ජාතික වැඩසටහන් ගණනාවක් ආරම්භ කළේය.

2010 - 2012 කාලයේදී සහ 2015 වසරේ දින 100 ආණ්ඩුවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යධුරය දැරූ ඔහු විදුලිබල මාෆියාවට එරෙහි දැඩි අරගලයක් සිදුකරමින් විකල්ප බලශක්ති ප්‍රභවයන් ප්‍රචලිත කිරීමට කටයුතු කළේය.

**යහපාලන රජය කාලයේදී සහගහන බදු ඉවත්කර ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් මිල පහත දමනු ලැබුවේ චම්පික රණවක විසිනි. ලංකා විදුලිබල මණ්ඩලය මෑත ඉතිහාසයේ ප්‍රථම වරට ලාභ උපයන ආයතනයක් බවට 2015 දී පත්වූයේ චම්පික රණවක අමාත්‍යවරයාගේ නායකත්වයෙනි.**

**ඔහු අවසන් වරට මෙහෙයවූ මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය යහපාලන රජය සමයේ පැවති හොඳම අමාත්‍යංශය බවට පාර්ලිමේන්තු පොදු කාරක ගිණුම් සභාවේ ඇගයීමට පාත්‍රවිය. 2015 වනතෙක් රජයට වැයබරක්වූ ඉඩම් සංවර්ධන සංස්ථාව සහ නාගරික සංවර්ධන අධිකාරිය ලාභ උපයන රාජ්‍ය ව්‍යවසායයන් බවට පත්කිරීමට චම්පික රණවක අමාත්‍යවරයාට හැකියාව ලැබිණි.**



# පාඨලී චම්පික රණවකයන්ගේ ශාසනික මෙහෙවර...

*සිංහල ජාතිය ලොව ශ්‍රේෂ්ඨ ජාතියක් බවට ඔසොවා තැබීමට අපරිමිත කාර්යභාරයක් ඉටුකරන බුදු සම්බුදු සසුනේ චිරස්ථිතිය පිණිස නිහඬ මෙහෙවරක් ඉටුකළ ශාසනමාමකයෙකි. දශක හතරක පමණවූ දේශපාලන ජීවිතය තුළ ත්‍රෛ නිකායික මහසඟරුවනේ අවවාද අනුශාසනා පරිදි පාඨලී චම්පික රණවකයන් ඉටුකළ ශාසනික මෙහෙවර මෙතෙකැයි කියා අවසන් කළ නොහැකි වුවත් දෑසසුන් හිතැති සැමගේ දැනගැනීම සඳහා ඒකී මෙහෙවර සංක්ෂිප්තව මෙලෙස ලියා තැබීම කාලෝචිත යැයි සිතමු.*



# මහනුවර අහස යට

ක්‍රිස්තු වර්ෂ 1592 දී කන්ද උඩරට පළමු පාලකයා ලෙස පළමුවෙනි විමලධර්මසූරිය මහා රජතුමා පත් විය.

දළදා හාමුදුරුවන් තමා සන්තකයේ පැවැතියා නම් ඔහුට රජකම බාර දෙන්නට එදා සිංහලයෝ කටයුතු කළහ. අපේ සඟරුවන දළදා හාමුදුරුවෝ රැක ගැනීමට විවිධ කාල වකවානුවල විඳි ගැහැට අපමණය. විටෙක සෙංකඩගලපුර නොසන්සුන් විය. විදේශීය ආක්‍රමණයන් හමුවේ දළදා හාමුදුරුවන් රැක ගැනීම අභියෝගයක් විය. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතීන් උඩරට පැමිණි සෑම මොහොතකම දළදා හාමුදුරුවන් වැඩ සිටියේ දළදා මාලිගාවට ගව් ගණනක් දුරිනි .

අපේ හාමුදුරුවරු දළදා හාමුදුරුවන් රැක ගන්නට සිය ජීවිතය පවා දෙවැනි කොට සැලකූහ. දුගියාට ද , යාචකයාට ද, දුප්පතාට ද, පොහොසතාට ද දළදා හාමුදුරුවන්ගේ කිසිදු වෙනසක් තිබුණේ නැත. මහ රජතුමා තම රාජකීය භෝජනය ද පළමුව පූජා කළේ අපේ දළදා හාමුදුරුවන්ටමය. 1818 නිදහස් අරගලයේ මහා වීරයා වූ වීර කැප්පෙටිපොළ මහ නිලමේ තුමා හිස සිඳීමට පෙර සිය අත තිබූ සළුව දළදා හාමුදුරුවන්ට පූජා කළේය.

වාරියපොල සුමංගල අනුනායක හාමුදුරුවන් ඉංග්‍රීසි කතිර කොඩිය බිම දැමුවේ ද දළදා මාලිගාව පිහිටි මහ පොළොව මතය. මී මැස්සන් කඩිසරව හදන හොඳම මී වද ටික වැදි රැහේ ඇත්තන් ඉස්සෙල්ලාම පුදන්නේ දළදා හාමුදුරුවන්ටය.

ගලා යන ඇළ දොළක නැවුම් දිය දෝත පළමුව පුදන්නේත් දළදා හාමුදුරුවන්ය. රටටම බත සපයන ගොවියා ද පළමු අස්වැන්නේ අග්‍ර කොටස අලුත් සහල් විදියට පුදන්නේත් දළදා හාමුදුරුවන්ටය. එය අපේ හෙළ සිරිතය. අප කළ හැකි හොඳම දෙය ඉටු කරන්නේ දළදා හාමුදුරුවන්ටය.

පාඨලී චම්පික රණවකයන් මහා සම්ප්‍රදායේ ම කෙනෙක් වන්නේ ඒ නිසාමය. සිහි කැඳවන තුරු හෝ ඉල්ලා සිටින තුරු බලා සිටීම ඔහුට කැප නැත. පැමිණි සෑම විටකම දළදා හාමුදුරුවන් වැඩ සිටින භූමියේ නිදහසේ ඇවිද ගිය ඔහු කළ යුතු දෑ නිරන්තරයෙන් සොයා බැලුවේය. රාජකාරි පංගුවෙන් ඇරඹී දළදා මාලිගාව වෙත නැවුම් බලාපොරොත්තු යථාර්ථයක් කරන්නට ඔහු පෙර ගමන්කරුවකු විය.

ඔහු දළදා මාලිගාව වෙනුවෙන් ඉටු කළ මෙහෙවර අපමණය.

මල්වතු අස්ගිරි උභය මහා විහාරීය අතිගරු මහා නායක මාහිමිපාණන් වහන්සේලාගේ අනුශාසනා නිරන්තරයෙන් ලැබීමට තරම් ඔහු වාසනාවන්තයෙක් විය. අතීතයේ රජ දවස පටන් පැවත එන මල්වතු අස්ගිරි ගරුතර මහා සංඝ රත්නය සෑම විට ම ඔහුට ආශිර්වාද කරන්නට පෙර මඟට වැඩම කළ බව නොරහසකි.

තෙරුවන් ගුණ සිහි කරමින්, මංගලම් ගායනය කරමින්, බෙර වයමින් අලංකාර වස්ත්‍රාභරණයෙන් සැරසී උඩ රට නර්තන විලාසය ඉදිරිපත් කරමින් අපේ කලා ශිල්පීහු ලෝක දෑස කන්ද උඩරට පෙරහර මංගල්‍යයට යොමු කළහ.

දළදා පෙරහරට දැන් අවුරුදු 1707 ඉක්මවා ඇතත් මේ කලා ශිල්පීන්ට පුහුණු වීමට, ඇඳුම් ලෑමට, ඉසිඹු ලෑමට

හෝ හිසට සෙවණක් මාලිගා පරිශ්‍රයේ තිබුණේ නැත. විටෙක ඔවුන් ඒ සඳහා යොදා ගත්තේ ඓතිහාසික මඟුල් මඩුවත්, දළදා මාලිගාවේ එළිපත්තේ පොඩි ඉඩකඩකුත් බව නොරහසකි. විටෙක බලාපොරොත්තු නොමැතිව ඇද හැලෙන මහා වැස්සට ඔවුන්ගේ ඇඳුම් ආයිත්තම් තෙතබරිත විය. අව් රශ්මියෙන් ඔවුන් පීඩාවට පත්විය. එහෙත් ඔවුන් සිය මෙහෙවර දිගින් දිගටම ඉටු කළ බව නොරහසකි. පෙරහර සමයේ දී දිනක් දළදා හාමුදුරුවන් වන්දනා කිරීමට පාඨලී චම්පික ඇමතිතුමා පැමිණියේය.

කලා ශිල්පීන් සිටින අයුරු ඔහු සියැසින්ම දුටුවේය. කලා ශිල්පීන්ගේ රාජකාරි පංගුව ඉටු කරන්නට ඔහු හිසට සෙවණක් ගොඩනැගීම ආරම්භ කළේය. සියවස් ගණනාවක් අමතක කර තිබූ ඒ කටයුත්ත තවත් ටික දවසකින් ම තවත් අඩියරක් දක්වා ඉදිරියට ගෙන ගියේය. අඩියර දෙකක් යටතේ ලබා දුන් ගොඩනැගිලි සංකීර්ණය දළදා මාලිගාවට පමණක් නොව, ශත වර්ෂ දාහතක් ඉක්මවා පවත්වන ලද දළදා පෙරහර ඉතිහාසයටද යුක්තිය ඉටු කළ බව මින් අවවාදිතය. අපේ ජාතක කතා බොහොමයක බෝධිසත්වයාණන් වහන්සේ ඇතෙක් වී ඇත් රැළට නායකකම් කර ඇත. ඇතා ළඟ බෝධිසත්ව ගුණ තිබේ. එදා රජතුමාගේ ඇතුන් දළදා මාලිගාවේ ඇතුන් බවට පත්විය. ඒ කාලයේ ගල් ලැද්දන් අලි ඇල්ලූ අතර පනික්කයෝ අලිඇතුන් ගාල් කළහ.



කාලය ගෙවී ගියේය. සුදු ජාතිකයෝ පැමිණ රජ්ජුරුවන් අල්ලාගෙන ගියහ. ඉන්පසුව ඇත්ගාල නැති විය. ඒ නිසා දළදා මාලිගාවේ අලි ඇතුන් වාසය කරන්නට ඇත්තේ ගස් යට ගල් වලට හේත්තු වී වන්නට ඇත.

ඔවුන් සඳහා මඩුවක් සාදන ලද්දේ අප කවුරුත් දන්නා රාජා ඇතා අසනීප වූ විටය. රාජා ඇතා පවා ජීවිත කාලයම ගෙවා තිබුණේ ගස් යටය. කෙසේවුවද, නිසි පරිදි පාලනය වන ඇත් ගාලක් දළදා මාලිගාවට තිබුණේ නැත. මාලිගාවේ ම රජකම් කරන මේ අලි ඇතුන් රාජකාරි කළේ අව්වට වැස්සට පමණක් නොව, ලෙඩට දුකට ප්‍රතිකාර ගැනීමට තැනක් පවා නොමැතිවය. දළදා පෙරහරට දුර කතර ගෙවාගෙන පැමිණි අලි ඇතුන් සිය ගණනක් ජලස්නානය කළේ ඒ අවට ගංගා සහ වැව්වලිනි. එය අවදානම් සහගත වුවද අපේ අලි ඇතුන්ට කවදාවත් කිසිදු නපුරක් වුණේ නැත. මාලිගාවට ඒ ගැන සිතා කරදර වීමට දැන් වුවමනා නැත. මේ වනවිට අලි ඇතුන් සඳහා ජල තටාකය ඉදිකර දළදා මාලිගාවට භාර දී ඇත. චම්පික රණවකයන් තුළ ඇති කළගුණ සැලකීම, සතුන්ට ආදරය සෙනෙහස දැක්වීමේ පිළිවෙත මේ තුළින් මනාව පැහැදිලි වේ.

දිනෙක ඔහු මඳ වෙලාවක් දළදා මාලිගා පරිශ්‍රය තුළින් දිව යන ධර්මපාල මාවත දෙස බලා සිටියේය. කාර්ය බහුල වූ ජනයා ඒ මොහොතේ විවිධ කටයුතු සඳහා ඇවිද යමින් සිටියහ. ඒ දෙස ඔහු විනාඩි දහයක පමණ කාලයක් බලා සිටින්නට ඇත. අද අප දකින්නේ එදා ඔහු දුටු ධර්මපාල මාවත නොවේ. ඒ ජනතාව හෝ අප හෝ ඔබතුමාට කිසිවක් කීවේ නැත. ඉල්ලුවේ ද නැත. එහෙත් කළ යුතු දෑ නිසි කලට කිරීම ඔහු සතු ගුණයක් බවට මේ නිදසුන් හැරෙන්නට තවත් නිදසුන් කුමටද? ඓතිහාසික මහමළුව ඉතිහාසයේ බොහෝ කතා මේ භූමියේ සඟවා ගෙන ඇති බව සක් සුදක් සේ පැහැදිලිය. මහමළුව අවස්ථා කිහිපයක දී ප්‍රතිසංස්කරණය කෙරිණි. එහෙත් අද වනවිට මහ වැසි ඇද හැලෙන වේලාවට නුවර වැවත්, මහමළුවත් දිස්වන්නේ එකම විදියටය. දෙනෝදහක් පය තබන මේ ඓතිහාසික මහමළුව ප්‍රතිසංස්කරණයට නැවතත් ඔහු මුල පිරුවේ දළදා හාමුදුරුවන් කෙරෙහි ඔහු තුළ ඇති සද්ධා සම්පන්න හැඟීම නිසා ය.

සිව් දිගින් මාලිගාවට පැමිණෙන සාධු ජනයා ද මේ වත් පිළිවෙත් දැක සතුටු වනු ඇත.

දළදා මාලිගාවට ඔබ සතු යුතුකම හා වගකීම දැන් ඉටුකර හමාරය. තවත් යුතුකම් හා වගකීම් ශේෂව ඇත්දැයි අපි නොදනිමු. ඔහු ඉටු කළ මෙහෙයට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුමය.

මාලිගාවට සේවය ඉටු කර නතර නොවූ ඔහු කන්ද උඩ රට ජනයාට ඇවැසි නගරයක් බවට පත් කරන්නට අපමණ වෙහෙසුණේය. කරන්නට අමාරු යයි පවසමින් අතහැර දමා තිබූ බොහෝ ව්‍යාපෘති /වැඩ සටහන් සක්‍රීය කරන්නට තරම් ඔහු නිර්භීත විය. සමහර සැලසුම් දසක ගණනාවක් හමස් පෙට්ටියට දමා තිබූ අතර ජනයාට හිත සුව පිණිස බොහෝ වැඩ සටහන් ඔහුගේ සැලසුම් මත නිර්මාණය විය.



ස්‍යාමෝපාලික මහානිකායේ අස්ගිරි පාර්ශවයේ මහානායක
අතිපූජ්‍ය වරකාගොඩ ඤාණරතන මහනාහිමිපාණන් වහන්සේගේ සුරතින් ඓතිහාසික දළදා මාලිගාවට
ඉටුකළ මෙහෙවර වෙනුවෙන් ඇගයුම් ලබමින්...

# රු. ලක්ෂ 2,500 ක වියදමින් ඓතිහාසික කන්ද උඩරට මහනුවර දළදා මන්දිරය ඇතුළු පූජානගරය සංවර්ධනය

- පෙරහරට පැමිණෙන නර්තන ශිල්පීන්ගේ පහසුව සඳහා පහසුකම් මධ්‍යස්ථාන දෙකක් ඉදිකිරීම
- ශ්‍රී දළදා මාලිගාවේ ඇත් පන්තියට ඇත්ගාලක් ඉදිකිරීම
- ඇත් පන්තියට නාන තටාකයක් ඉදිකිරීම
- මහමළුවට ජලසැපයුම් පද්ධතියක් හා කාණු පද්ධතියක් ඉදිකිරීම
- ශ්‍රී දළදා මන්දිරයේ ධර්මපාල මාවත ප්‍රවිශ්ට මාර්ගය දෙපස ප්‍රදේශය භූදර්ශනය කිරීම













## රු. ලක්ෂ 1,200 ක වියදමින් අනුරාධපුර ඓතිහාසික පූජා නගරය සංවර්ධනය කිරීම

- ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩසිටින මහමෙව්නා උයනේ නැගෙනහිර ද්වාරය ආශ්‍රිතව භූදර්ශනය අලංකරණය කිරීම.
- ඉසුරුමුණිය බුද්ධ මන්දිරය ප්‍රතිසංස්කරණය
- ලංකාරාමය බුද්ධ මන්දිරය ප්‍රතිසංස්කරණය
- ථූපාරාමය සංඝාවාසය ඉදිකිරීම
- මිරිසවැටිය දානශාලාව ඉදිකිරීම (පළමු අදියර)









## රු. ලක්ෂ 85 ක වියදමින් තන්තිරිමලේ ඓතිහාසික පූජා නගරයේ යටිතල පහසුකම් සංවර්ධනය



## රු. ලක්ෂ 1,200 ක වියදමින් ඓතිහාසික කතරගම කිරිවෙහෙර පූජාභූමිය සංවර්ධනය

- කතරගම පූජනීය නගරයේ උතුරු පිවිසුමේ පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
- කතරගම පූජනීය නගරයේ භෞතික සැලසුම් ව්‍යාපෘති කාර්යාලය අසළ පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
- කතරගම පූජනීය නගරයේ කිරිවෙහෙර අසළ පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම
- කතරගම පූජනීය නගරයේ ප්‍රභූ පිවිසුම අසළ පොලිස් මුරපොලක් ඉදිකිරීම
- කතරගම පූජනීය නගරයේ උතුරු පිවිසුම අසළ පොලිස් මුරපොලක් ඉදිකිරීම
- කතරගම පූජනීය නගරයේ ගිතමිගම පිවිසුම අසළ පොලිස් මුරපොලක් ඉදිකිරීම
- කතරගම පූජනීය නගරයේ නැගෙනහිර පිවිසුම අසළ පොලිස් මුරපොලක් ඉදිකිරීම
- කතරගම කිරිවෙහෙර සිට මහදේවාලය දක්වා මඟ දෙපස වීදිපහන් පද්ධතිය සැකසීම
- කිරිවෙහෙර සිට කතරගම මහදේවාලය අතර ආරක්ෂිත වැට ප්‍රතිසංස්කරණය







## රු. ලක්ෂ 2,000 ක වියදමින් සෙල්ල කතරගම සහ වැඩිහිටිකන්ද පුදබිම සංවර්ධනය

- වැඩිහිටිකන්ද කඩ සංකීර්ණය ඉදිකිරීම (පළමු අදියර)
- සෙල්ල කරතගම මහසෙන් විහාරයේ වාහල්කඩ සහ ඇතුළත භූමි අලංකරණය
- සෙල්ල කතරගම දේවාලයට ප්‍රවේශ මාර්ග සහ වීදි පහන් සැකසීම










# වසර 400කට පසු රු. ලක්ෂ 889 ක වියදමින් රත්නපුර මහ සමන් දේවාලය ප්‍රතිසංස්කරණය




රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව අතර ඉමහත් ගෞරවයට හා වන්දනීය බුහුමනට පාත්‍ර වන, දීර්ඝ කාලීන ඉතිහාසයකින් හා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත සබරගමුව මහ සමන් දේවාලයේ දෙවියන් වැඩසිටින මාලිගයේ ප්‍රධාන වහලය, හඳුන්කුඩම, දිග්ගේ, ශාන්ති මණ්ඩපය, ප්‍රධාන ද්වාරය, වාහල්කඩ 8, අනමේත්‍ර, බෙත්ම යනාදිය සංරක්ෂණය වන පරිදි සංවර්ධන හා අලුත්වැඩියා කටයුතු රු. මිලියන 76ක ආයෝජනයකින් සිදුකිරීම.






**කොළඹ නගරයේ විහාරස්ථාන 42ක් රුපියල් ලක්ෂ 450 ක වියදමින් සංවර්ධනය කිරීම**

- ගුණසිංහපුර පූර්වාරාමය
- මාලිගාවත්ත බෙත්තාරාම මහා විහාරස්ථානය
- කොළඹ 10 මාලිගාවත්ත බෝසෙවණ විහාරය
- කොළඹ 10 සුබෝධාරාමය
- කොළඹ 10 අබේසිංහාරාමය
- කොළඹ 10 සුධර්මාරාමය
- කොළඹ 10 ප්‍රියදර්ශනාරාමය
- කොළඹ 10 ජේතවනාරාමය
- කොළඹ 10 සද්ධර්මාරාමය
- ග්‍රෑන්ඩ්පාස් ඉසිපතනාරාම විහාරස්ථානය
- කොළඹ 14 ජයන්ත මල්ලිමාරච්චි මාවත ශ්‍රී ලුම්බිණි විහාරස්ථානය
- කොළඹ 14 ශාක්‍ය සිංහාරාම විහාරස්ථානය
- කොළඹ 14 ධර්ම නිකේතනය විහාරය
- කොළඹ 14 ස්ටේඩියම්ගම ශ්‍රී සුගතාරාමය
- කොළඹ 15 බ්ලූමැන්ඩල් ශ්‍රී සරණංකර විහාරය
- කොළඹ 15 බ්ලූමැන්ඩල් ලංකාරාමය
- කොළඹ 15 සිරි නන්දනාරාමය
- කොළඹ 15 ශ්‍රී ධවලසිංහාරාමය
- කොළඹ 15 මිරන්දාරාම පුරාණ විහාරය
- කොළඹ 15 මෝදර ශ්‍රී බෝධි සමුද්‍රාරාමය
- කොළඹ 15 ශ්‍රී උභයවර්ධනාරාමය
- මට්ටක්කුලිය ශ්‍රී කල්‍යාණිගංගාරාමය
- ඇල්විටිගල මාවත ශ්‍රී ධර්මදූත විහාරය
- කොටහේන දීපදුත්තාරාම තායි රජමහා විහාරය
- නිව් බසාර් ජේතවන විහාරය
- පංචිකාවත්ත අබේසිංහාරාමය
- බොරැල්ල සීවලිපුර ගඟපහළ විවේකාරාමය
- බොරැල්ල පොත්ගුල් විහාරය
- නාරාහේන්පිට නාවල පාරේ සද්ධර්මාරාමය





- නාරාහේන්පිට නාවල පාරේ ධර්මායතනය
- නාරාහේන්පිට සමාධි විහාරය
- කොටහේන ශ්‍රී පරමානන්ද ධර්ම විද්‍යාලය
- දෙමටගොඩ මහා විසුද්ධාරාම විහාරස්ථානය
- දෙමටගොඩ ශ්‍රී බෝධි විහාරස්ථානය
- දෙමටගොඩ වේළුවනාරාමය
- දෙමටගොඩ මල්ලිකාරාමය
- මාලිගාවත්ත මහාවංශාරාම විහාරස්ථානය
- මාලිගාවත්ත සුබෝධාරාමය
- කොළඹ 13 සුමිත්‍රාරාම විහාරය
- කොළඹ 13 ශ්‍රී පරමානන්ද පුරාණ විහාරය
- කොළඹ 14 අශෝකාරාමය
- කොළඹ 02 කුමාරන් රත්නම් මාවත ගුණවර්ධනාරාමය









## හෝමාගම විහාරස්ථාන 10 ක් ලක්ෂ 200 ක වියදමින් සංවර්ධනය කිරීම

- හෝමාගම සිරි සුගතබිම්බාරාම විහාරස්ථානය
- මීගොඩ සුමනාරාම පුරාණ විහාරය
- හෝමාගම පුරාණ විහාරස්ථානය
- වටරැක අඹගහවත්ත ශ්‍රී ඉන්ද්‍රාරාම විහාරස්ථානය
- වටරැක පාදුක්ක ශ්‍රී සෝමරතන බෞද්ධ මධ්‍යස්ථානය
- හබරකඩ ශ්‍රී ශෛලාන්තායතන පුරාණ විහාරස්ථානය
- හබරකඩ ධර්මවිජයාශ්‍රම විහාරය
- පනාගොඩ විමලාරාම විහාරස්ථානය
- හෝමාගම හබරකඩ සිරි සුධම්මාශ්‍රම මෙහෙණි ආරාමය
- පොල්ගස්ඕවිට ශ්‍රී නිලංකා බෞද්ධ මධ්‍යස්ථානය









ස්‍යාමෝපාලික මහානිකායේ මල්වතු පාර්ශවයේ මහානායක
අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාද ලබමින්...





## මහරගම විහාරස්ථාන 10 ක් ලක්ෂ 150 ක වියදමින් සංවර්ධනය කිරීම

- මහරගම සිරි වජිරඥාණ ධර්මායතනය
- රුක්මලේ ධර්මවිජයාලෝක විහාරය
- මාදිවෙල,කෝට්ටේ ශ්‍රී සිලවනාරාම විහාරස්ථානය
- මාදිවෙල කෝට්ටේ ශ්‍රී ඥාණානන්ද බෞද්ධ මධ්‍යස්ථානය
- තලවතුගොඩ ගනේලන්ද රජමහා විහාරස්ථානය
- නාවින්න ඉසිපතනාරාමය
- මහරගම පඤ්ඤාතිලකාරාමය
- මොරකැටිය පරම ධම්ම විහාරය
- පන්නිපිටිය දේවාධාර විහාරය
- විපශ්‍යාරාම පුරාණ විහාරය





## අවිස්සාවේල්ල විහාරස්ථාන 07ක් ලක්ෂ 105 ක වියදමින් සංවර්ධනය කිරීම

- කොස්ගම දොළඉහල ශ්‍රී විවේකාරාමය
- කොටහැර රාජගිරි විහාරය
- උක්වත්ත ජයබෝධි විහාරය
- දුන්කලහේන ශ්‍රී සුමන විහාරය
- තුන්නාන ශ්‍රී ජයසුමනාරාමය
- මලගල පාදුක්ක පරමධම්ම කිත්‍යාරාම විහාරස්ථානය
- ඥාණසීහ සර්වෝදය සාමණේර ආයතනය









## කැස්බෑව විහාරස්ථාන 07 ක් ලක්ෂ 87 ක වියදමින් සංවර්ධනය කිරීම

- පැපිලියාන සුනේත්‍රාදේවී පිරිවෙන් රජමහා විහාරය
- රත්තනපිටිය පාර පරම ධර්මවර්ධනාරාමය
- කොළමුන්න ශ්‍රී බිම්බාරාම විහාරස්ථානය
- මාකන්දන මඩපාත සංකල්ප විහාරය
- පිළියන්දල, වෑවල, ගඟබඩ ධම්මදීපාරාම විහාරස්ථානය
- මඩපාත ශ්‍රී සද්ධර්මෝදය විහාරය
- පොල්ගස්ඕවිට ශ්‍රී විමලාරාම විහාරය






**සමස්ත ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක
අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහනාහිමිපාණන් වහන්සේ වෙතින්
ශාසනාභිමාන්‍ය ජනරංජන දේශබන්දු ගෞරවනාම ලබමින්...**

## කෝට්ටේ විහාරස්ථාන 05ක් රුපියල් ලක්ෂ 50 ක වියදමින් සංවර්ධනය කිරීම

- කෝට්ටේ සිරි පැරකුම්බා පිරිවෙන
- ඇතුල්කෝට්ටේ මහින්දාරාමය
- රාජගිරිය ජයසේකරාරාමය
- ඇතුල්කෝට්ටේ ධර්මාශ්‍රමය
- ඔබේසේකරපුර ධර්මදූතාශ්‍රමය












## කඩුවෙල විහාරස්ථාන 06ක් රු. ලක්ෂ 105 ක වියදමින් සංවර්ධනය කිරීම

- තලංගම මයුරපාද පිරිවෙන් මහා විහාරය
- කඩුවෙල බුරුම බෞද්ධ මධ්‍යස්ථානය
- පහළබෝමිරිය, මොරවකවත්ත අභයනිකේතනාරාමය
- වැලිවිට විජිතාරාමය
- කොතලාවල සෝම සෙත්රුවන විහාරය
- යාකාල අභිනවාරාමය



## දෙහිවල - ගල්කිස්ස විහාරස්ථාන 04ක් රු. ලක්ෂ 40 ක වියදමින් සංවර්ධනය කිරීම

- දෙහිවල ශ්‍රී මංගලාරාම විහාරය
- සාරානාත් බෞද්ධ මධ්‍යස්ථානය
- දෙහිවල ශ්‍රී සංඝරාජ විහාරය
- කොහුවල චින්තාරාම දසසිල් මාතා ආරාමය








ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ මහානායක
අතිපූජ්‍ය නාපාන පේමසිරි මහනාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාද ලබමින්...

## මොරටුව විහාරස්ථාන 05 ක්
## රු. ලක්ෂ 156 ක වියදමින් සංවර්ධනය කිරීම

- මොරටුව සොයිසාරාම විහාරස්ථානය
- එගොඩ උයන තාලරුක්කාරාම විහාරස්ථානය
- ලුනාව බෝධිරාජාරාමය
- මොරටුව ජිනේන්ද්‍රාරාම විහාරය
- කල්දමුල්ල සුධර්මාරාමය








## රත්මලාන විහාරස්ථාන 07ක්
## රු. ලක්ෂ 98 ක වියදමින් සංවර්ධනය කිරීම

- රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙන
- රත්මලාන පුෂ්පාරාමය
- අත්තිඩිය ජලනන්දනාරාමය
- රත්මලාන චක්කින්දාරාමය
- රත්මලාන ධර්මාරාමය
- මාදොළුවාවේ සෝභිත ගිලාන උපස්ථාන මධ්‍යස්ථානය
- රත්මලාන සුබෝධාරාමය

## කොලොන්නාව විහාරස්ථාන 07ක්
## රු. ලක්ෂ 135 ක වියදමින් සංවර්ධනය කිරීම

- මීතොටමුල්ල ශ්‍රී ක්ෂේත්‍රාරාම විහාරස්ථානය
- කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාමය
- මණ්ඩවිල අංගොඩ ශ්‍රී අභයසුමනාරාම විහාරස්ථානය
- මුල්ලේරියාව මහින්දාරාමය (ජාතික ළමා අධ්‍යාපන ආයතනය)
- කොලොන්නාවේ පරමධම්මෝදය විහාරය
- වැල්ලම්පිටිය සුමේධාරාමය
- කොටිකාවත්ත ශ්‍රී නාගරුක්ඛාරාමය





## රු. ලක්ෂ 400 ක වියදමින් බස්නාහිර පළාතේ අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මෙත්සිත් අරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

- ප්‍රධාන මධ්‍යස්ථානය - හෝමාගම ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධි විහාරය
- කොළඹ දිස්ත්‍රික් මධ්‍යස්ථානය : අවිස්සාවේල්ල මුන්ඩිගල ශ්‍රී සුමනගිරි ආරණ්‍ය සේනාසනය
- ගම්පහ දිස්ත්‍රික් මධ්‍යස්ථානය : බියගම තායි ශ්‍රී ලංකා බෞද්ධ මධ්‍යස්ථානය













සයාමෝපාලික මහානිකායේ මල්වතුපාර්ශවයේ අනුනායක
අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි නාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාද ලබමින්...

## හෝමාගම ඉඹුලකන්ද අක්කර 08ක රජයේ ඉඩම ශ්‍රී සම්බුද්ධි විහාරස්ථානයට පූජාකිරීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

හෝමාගම ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධි විහාරාධිපතිව හා මරදාන ශ්‍රී ලංකා විද්‍යාල මහා පිරිවෙන් විහාරාධිපතිව වැඩවිසූ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ බස්නාහිර පළාතේ හිටපු ප්‍රධාන සංඝනායක පූජ්‍යතර ආචාර්ය නාගොඩ අමරවංශ නායක ස්වාමිපාදයාණන් වහන්සේගේ අනුශාසනා පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ දෙවන උසම ස්ථානය වන ඓතිහාසික හෝමාගම ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධි විහාරස්ථානය නීත්‍යානුකූලව බෞද්ධ විහාරස්ථානයක් ලෙස ලියාපදිංචි කර ගැනීමටත්, අක්කර අටක් පමණවූ කහටගහලන්ද හෙවත් ඉඹුලකන්ද රජයේ ඉඩම පූජා භූමියක් ලෙස නම් කර එම විහාරස්ථානය වෙත පූජා කිරීමටත් පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදුන්නේ හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා විසිනි.









## රු. ලක්ෂ 400 ක වියදමින් කෝට්ටේ රජමහා විහාරය සංවර්ධනය කිරීම







- සමස්ත ලංකා අමරපුර සංඝ සභාවේ මූලස්ථානය ඉදිකිරීමට ශ්‍රී ජයවර්ධනපුර අගනගරයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සතු මැදිහත්වීමෙන් භූමියක් පූජාකිරීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම

- රු. ලක්ෂ 100 ක වියදමින් ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ නාරාහේන්පිට පිහිටි සංඝ මූලස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම

- රු. ලක්ෂ 170 ක වියදමින් මහනුවර දොඩම්වෙල ශ්‍රී නාථ දේවාලය ප්‍රතිසංස්කරණය කිරීම

- රු. ලක්ෂ 350 ක වියදමින් මහනුවර මුරුතලාව සංඛශිලාරාමයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ඉදිකිරීම









සයාමෝපාලික මහානිකායේ මල්වතුපාර්ශවයේ අනුනායක
අතිපූජ්‍ය දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්මාභිධාන නාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාද ලබමින්...

## රු. ලක්ෂ 762 ක වියදමින් මහනුවර දිස්ත්‍රික්කයේ රාමඤ්ඤ නිකායට සම්බන්ධ විහාරස්ථාන 10ක් සංවර්ධනය කිරීම



- මැණික්හින්න හුරීකඩුව විද්‍යාසාගර පිරිවෙන් විහාරය
- දිගන අරුක්වත්ත මිහිඳු ධර්මපීඨය
- අප්ලන්ඩ් ලෝකානන්ද විහාරය
- කුණ්ඩසාලේ අමින්දාගොඩ ශ්‍රී සුමනාරාමය
- පිළවල නෙළුම්පත්හින්න ශ්‍රී ඉසිපතනාරාමය
- මැදමහනුවර සඳගිරි තපෝවන පිරිවෙන
- පල්ලේකැලේ සම්බෝධි විහාරය
- නාරම්පනාව දහම් සෙවණ භාවනා මධ්‍යස්ථානය
- දිගන තෙළඹුහින්න ශ්‍රී ධර්මවර්ධනාරාමය
- මැදමහනුවර ශ්‍රී ධර්මවර්ධනාරාමය







## රු. ලක්ෂ 1,145 ක වියදමින් ගම්පහ දිස්ත්‍රික්කයේ විහාරස්ථාන සංවර්ධනය

- රදාවාන මණ්ඩාවිල ශ්‍රී ප්‍රියදර්ශනාරාමය
- රාගම ශ්‍රී චන්ද්‍රාරාමය
- රද්දොළුව අභිනවාරාම විහාරය
- මීරිගම කෝපිවත්ත බෞද්ධ ශ්‍රමණාලය විහාරස්ථානය
- අකරවිට ශ්‍රී අශෝකාරාමය
- ගනේමුල්ල කුඩාබොල්ලත ශ්‍රී සුමනවීරසිංහාරාමය
- ගනේමුල්ල සිරිමල්වතු රජමහා විහාරය
- නිට්ටඹුව වේබඩගල්ල ශ්‍රී විවේකාරාමය
- ජාඇල නිවන්දගම ශ්‍රී නීග්‍රෝධාරාමය
- රාගම ගොඩපාලුව සිරි ශාසනෝදාරාමය
- කඳාන පොල්පිතිමූකලාන අශෝකාරාමය
- බෙම්මුල්ල විගොඩ ශ්‍රී ධර්මරාජාරාම විහාරය
- යක්කඩුව ශ්‍රී සද්ධර්මෝදයාරාමය
- බඩල්ගම අකරංගහ ශ්‍රී ජයසුමනාරාමය
- වත්තල තෙලඟපාත ශ්‍රී සුධර්මාරාමය
- රාගම වල්පොල සිරි සුදත්තාරාම පුරාණ විහාරය







- ජාඇල බටගම ශ්‍රී ජයවර්ධනාරාමය
- ආනියාකන්ද ජයසමරුගම ශ්‍රී රාහුල විහාරය
- වත්තල චිත්ත සමාධි භාවනා මධ්‍යස්ථානය
- දිවුලපිටිය සුගතමන්දිරාරාමය
- වත්තල හේකිත්ත ගංගාතිලක විහාරය
- මාකොල විජේතුංගාරාමය
- මැදගම සිරිසුනන්දාරාම ධර්මදූත පිරිවෙන
- මහර ගෝනහේන ශ්‍රී සද්ධර්ම තිලකාරාමය
- මහර ගෝනහේන ශ්‍රී බෙත්තාරාම විහාරය
- මීරිගම වත්තේ ගෙදර නාගවනාරාම පුරාණ විහාරය
- මීරිගම මාලිගාතැන්න ශ්‍රී රාජාරාම පුරාණ විහාරය
- බියගම මීගහවත්ත ශ්‍රී නාගරුක්ඛාරාමය
- බියගම ගණේවත්ත පුරාණ විහාරය
- මීරිගම පතගම ශ්‍රී වික්‍රමාරාමය
- මීරිගම උතුවම් බෝගහවත්ත ශ්‍රී සුදර්ශනාරාමය
- මීරිගම ඉඹුලන්වල පුරාණ විහාරය
- වත්තල ශ්‍රී සුගත ධම්මිකා ආශ්‍රමය
- අත්තනගල්ල මීවිතිගම්මන නාලිකාරාමය
- මහර නාරන්වල ශ්‍රී සුමනකීර්ති පිරිවෙන් විහාරය







සාධාරණ සමාජයක් උදෙසා ජනතා ව්‍යාපාරයේ නිර්මාතෘ කෝට්ටේ ශ්‍රී නාගවිහාරාධිපති
අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාද ලබමින්...

### රු. ලක්ෂ 316 ක වියදමින් කළුතර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන 22 ක් සංවර්ධනය කිරීම

- කළුතර දකුණ ශ්‍රී පූර්වාරාම ධර්ම විජය පිරිවෙන් විහාරය
- කළුතර උතුර පුලිනතලාරාමය
- නාගොඩ ශ්‍රී ජයවර්ධන ගිලානෝපස්ථාන ආරාමය
- වස්කඩුව ගනේවත්ත පුරාණ විහාරය
- මහවස්කඩුව කන්දේ පුරාණ විහාරය
- කිතුලාව අමරසිංහාරාමය
- පානදුර සුධර්මාරාම පුරාණ විහාරය
- පානදුර විවේකනන්දාරාමය
- පානදුර වලාන විජය සෞගත පිරිවෙන
- පානදුර පරත්ත බෝධිරාජ විහාරය
- දොඩංගොඩ කප්දූව බෙත්තාරාමය
- අලුබෝමුල්ල උදබෝදිතාරාමය
- මතුගම කීරන්තිඩිය ශ්‍රී සුගතාරාමය
- බුලත්සිංහල අමරෙගෙදර විහාරස්ථානය
- ඉඳිගස්තුඩුව මීගම සිරි නන්දනාරාමය
- බුලත්සිංහල යහලවත්ත බෙත්තාරාම විහාරය
- වස්කඩුව ක්ෂේත්‍රාරාමය
- කළුතර ඇතගම නන්ද තපෝවන ධර්මදූත මධ්‍යස්ථානය
- කළුතර උතුර සුමිත්‍රාරාම විහාරස්ථානය
- කළුතර උතුර බෝධිරුක්ඛාරාම විහාරය
- කළුතර කලමුල්ල ශ්‍රී ජයවර්ධනාරාමය
- කළුතර දකුණ බෙත්තාරාම විහාරය





## රු. ලක්ෂ 115 ක වියදමින් රත්නපුර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන 11 ක් සංවර්ධනය කිරීම

- ඇඹිලිපිටිය හිඟුරආර ශ්‍රී බෝධිරාජ පිරිවෙන් විහාරය
- රත්නපුර ඉන්දොල පුරාණ විහාරය
- පුරාණ වස් ගල්ලෙන් විහාරස්ථානය
- පැලෑඳගම ශ්‍රී සුදර්ශනාරාමය
- වේවැල්වත්ත ශ්‍රී විජිතාරාම විහාරස්ථානය
- ඇහැළියගොඩ ඉද්දමල්ගොඩ දෙල්ගමු රජමහා විහාරය
- පැල්මඩුල්ල පාලුගම්පොළ විහාරය
- පැල්මඩුල්ල සිරි විවේකාරාමය
- කුරුවිට ශ්‍රී ආනන්ද බෝධි විහාරය
- ගොඩකවෙල අල්පිටිය ඇලපාත විහාරස්ථානය
- රත්නපුර වැලිඟපොල ශ්‍රී බෝධිරුක්ඛාරාම පුරාණ විහාරය



## රු. ලක්ෂ 50 ක වියදමින් අම්පාර දිස්ත්‍රික්කයේ විහාරස්ථාන 03 ක් සංවර්ධනය කිරීම

- අරන්තලාව භික්ෂු ස්මාරක විහාරස්ථානය
- දෙහිඅත්තකණ්ඩිය මුවගම්මන ධම්මදුත්තාරාම විහාරය
- සේනාගම පිරිවෙන් විහාරස්ථානය







**පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා ලෙස "වනසෙනසුන්" නමින් ව්‍යාපෘතියක් හඳුන්වාදීම සහ දිවයින පුරා ආරණ්‍ය සේනාසන 72ක් ඉදිකිරීමට බලපත්‍ර ලබාදීම**

- පරිසර අමාත්‍යවරයා ලෙස අරන්තලාව භික්ෂු ඝාතනය සිදුවූ ස්ථානයේ විශාල නා උයනක් රෝපණය කිරීම
- පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා ලෙස වනජීවී දෙපාර්තමේන්තුව සතුව පැවති ඇත්දළ ප්‍රධාන බෞද්ධ විහාරස්ථාන වෙත පූජාකිරීමට කටයුතු කිරීම
- පුත්තලම කල්පිටිය දළුව ශ්‍රී අන්තර් සමුද්ධ පිරිවෙන් විහාරය රු. ලක්ෂ 50 ක වියදමින් සංවර්ධනය කිරීම
- ගාල්ල බූස්ස කැදලකඳුරුපේ ශ්‍රී සද්ධර්මාරාම විහාරය රු. ලක්ෂ 30 ක වියදමින් සංවර්ධනය කිරීම
- "දම්පල් දරුවෝ" ජාතික සංවිධානයේ ප්‍රධාන අනුශාසකයා ලෙස බෝසත් ගුණැති අනගාරික ධර්මපාලතුමන්ගේ චින්තනය ජනගත කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම



කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහානායක
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කුලපති
අතිපූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලංකාර මහනාහිමිපාණන් වහන්සේ සමඟ...

## බෞද්ධ සංස්කෘතිකාංග රැකගැනීම සඳහා බෙල්ලන්විල ඇසළ මහා පෙරහැර, කෝට්ටේ රජමහා විහාරයේ ඇසළ පෙරහැර, කොටිකාවත්ත නාගරුක්ඛාරාම විහාරයේ පෙරහැර හා හෝමාගම පොසොන් පෙරහැරට වාර්ෂිකව දායකවීම





අමරපුර ශ්‍රී ධම්මරක්ෂිත මහානිකායේ මහානායක
අතිපූජ්‍ය තිරිකුණාමලයේ ආනන්ද මහනාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාද ලබමින්...










**පාඨලී චම්පික රණවක යනු...**

අතීත බුදුවරයන් වහන්සේලාට සෙවණ දුන්
පලොල් (පාඨලී) හා සපුමල් (චම්පික) ශාඛවල ගුණ සුවඳ
රැකගෙන සසුන රකින්නට දිවිහිමියෙන් කටයුතු කරන
සැබෑ බෞද්ධ නායකයෙකි

076 711 50 99 | 07 7578 7578
011 207 69 06 | 011 286 61 25
011 288 25 85
patalichampika@gmail.com
www.champikaranawaka.lk
www.facebook.com/PataliChampika
http://twitter.com/pcranawaka
WhatsApp & SMS - 078 5000 750

